

# සසල දිවිමග නිසල කරනට

**(ආතතිය, මානසික පීඩනය පාලනය කරගැනීමට අත්වැලක්)**

**පූජ්‍ය බෝධි චිත්තා මෙහෙණින් වහන්සේ**
මෙල්බන් නුවර නිසල අරණ

12

## දැවෙන සිත් නිවී සැනසේවා

ලෝභ, ද්වේශ, මෝහ මුල් වූ චිත්තාවේගයන්ට යට වී ඇති නියම උපදේශයකින් තොරව දියුණු වූ බුද්ධිය භයානක වන්නේ, එයට කළ නොහැකි අපරාධයක්, විනාශයක් නොමැති නිසාය. මෙසේ මංමුලාවූ බුද්ධිය තම ලෝභයන් හා ද්වේශයන් සන්තර්පනය කිරීමට යොදා ගෙන ඇති අයුරු ලොව නිපදවා ඇති න්‍යෂ්ඨික අවි ආයුධ ප්‍රමාණය දෙස බැලූ විට පෙනී යයි. අද දවසේ මානව වර්ගයා තනා ඇති සියළු න්‍යෂ්ඨික බෝම්බ එකට එකතු කර, එක විට පුපුරා හැරිය හොත් මෙම පෘථිවිය දැවී අළු වී යාමට ගත වන්නේ සුලු මොහොතකි. එපමණක් නොව මෙම කම්පනය අප චන්ද්‍රයාට දැනී එයටද හානි සිදු වී විනාශ වී යා හැකි බව විද්‍යාඥයින්ගේ මතයයි.

දූරදර්ශී නුවණකින් හෙබි Einstein නම් විද්‍යාවේ පියා, ආගම දහමක හවුහරණක් නැති විද්‍යාව, "අන්ධයකුට" සමාන කළේ මෙසේ යා යුතු මග නොපෙනී, නොදැනී ගියහොත් විද්‍යාව මිනිසාට පිහිට පිණිස නොව, විනාශය පිණිසත් තව තවත් මානව වර්ගයාගේ අසරණ වීමට, දුකට, වේදනාවට හා අසහනයට හේතු විය හැකි නිසාවෙනි. එසේම අන්ධ, මිථ්‍යා විශ්වාසයන්හි පැටලී බුද්ධියට ගෝචර නොවන, විද්‍යාවෙන් තර්කානුකූලව පිළිගැනීමට නොහැකි දේ උගන්වන ආගම දහම, අනාගත මානව වර්ගයාගේ සීඝ්‍ර බුද්ධි දියුණුවත් සමඟම, ඔවුන් කිසිවකු නොදැකපු, නොඇසූ, අසාධාරණ ලෙස සමහරුන්ට පමණක් අන්ත දුක් විඳීමට ඉඩ සලසා තව සමහරුන්ට සැප විඳීමට ඉඩ සැලසූ, ස්වභාව ධර්මයාගෙන් වෙන විපතින් පවා මානව වර්ගයා පීඩා විඳින විට ඒවා නොවලක්වා තමා මැවූ සියල්ලටම දුක් පීඩා විඳීමට ඉඩ හරින්නා වූ මැවුම්කාර සර්ව බලධාරි දෙවියෙකු වෙත, අන්ධ විශ්වාසයෙන්, ඇදබැඳ තබා කොටුකර ගැනීම අසීරු කරුණක් වෙනවාත් සමග ම, එම ආගම් පැතිරිය නොහැකි තත්ත්වයට පත් වනු ඔහු කල්තියා දුටුවේය.

විද්‍යාවේ දියුණුවත් සමඟම මිනිසා, ලෝකයේ සත්‍ය ස්වභාවයන් ගැන යම් අවබෝධයක් ඇති කර ගනී. මෙසේ බුද්ධිය දියුණු වූ සමාජය, ඉදිරියේදී වැළඳ ගනුයේ අන්ධ විශ්වාසයන්ගෙන් තොර වූ, බුද්ධියට ගෝචර වූ තර්කානුකූල වූ කරුණු සහිතව පිළිගැනීමට හැකි ලෝකයේ යථාර්ථය හෙළිකර දෙන්නා වූ ආගම දහමකි.

ඉදිරි අනාගතයට ඔබින, ජනප්‍රියතාවයෙන් මිනි සුන් අතර පැතිරෙන ආගම කුමක් විය හැකි දැයි විද්‍යාවේ පියා වන අයින්ස්ටයින් (Einstein) ගෙන් විමසූ විට ඔහු පැවසුවේ යැයි මතයක්ව පවත්නා ලෝක ප්‍රසිද්ධ ප්‍රකාශයට අවධානය යොමු කිරීම වටී. එය මෙසේය.

"The religion of the furture will be a cosmic religion. It should transcend a personal "God" and avoid dogmas and Theology. Covering both the natural and the spritual, it should be based on a religious sense arising from direct experience of all things, natural and spritual as a meaningful unity.

Buddhism answers this description. If there is any religion that would cope with mordern scientific needs, It would be Buddhism"

"අනාගත දහම වන්නේ විශ්වලෝකීය ආගමකි. එය ස්වකීය සර්වබලධාරී, මැවුම්කාර දෙවියන් ඉක්මවා යා යුතු අතර සිද්ධාන්තයක් ලෙස සලකා හුදු මතයන් සහ දේවධර්මවාද වලින් බැහැර වූවක් විය යුතුය. ස්වාභාවිකත්වයත්, අධ්‍යාත්මිකයත් යන දෙකොටසම අන්තර්ගත කර ගනිමින්, එහි පදනම කරගත යුත්තේ ස්වභාවිකත්වයේ හා අධ්‍යාත්මයේ එක් වීම, සියළුම දේ තුළින් සෘජුවම අත්දැකීමෙන් ප්‍රත්‍යක්ෂවීම නිසා හටගන්නා ධාර්මික අවබෝධයයි.

බුදු දහම මෙම විස්තරයට අනුකූල වේ. නවීන විද්‍යාත්මක අවශ්‍යතාවයනට ගැලපෙන යම් ආගමක් වේද එය නම් බුදු දහමයි" යනුවෙන් මෙම ප්‍රකාශය සරලව සිංහලයට පරිවර්තනය කර ගත හැකිය.



මෙය බෞද්ධ ග්‍රන්ථවල ආධාරයෙන් නිර්වචනය කර ගත හැක්කේ "යථා භූත ඥාන දස්සනං" යනුවෙනි. එනම් පෙනෙන අයුරින් තේරුම් ගැනීම නොව සියළු දේහි සත්‍ය ස්වභාවය විනිවිද ගොස් ඒවා ඇති සැටියෙන්ම අත්දැක අවබෝධ කර ගැනීමයි. සත්‍යය නම් සෘජුවම අත්දැකීමෙන් ලබන අවබෝධයයි. මෙය දෙවියන්ගේ ඇතුළුව කිසිවෙකුගේ ප්‍රකාශයන් හෝ නිගමනයන් පිළිනොගෙන සෘජුවම තමා තුළින්ම ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙන් යථා ස්වභාවය ගැන ලැබෙන අවබෝධයයි. ඇල්බර්ට් අයින්ස්ටයින් නම් මහා විද්‍යාඥයා මෙහිදී Direct experience නැතිනම් සෘජු අවබෝධය යනුවෙන් මෙය අදහස් කලා විය හැකි යැයි යමෙකුට සිතිය නොහැකිද?

බුදු දහම තරම් මානව වර්ගයාගේ බුද්ධියට ගරු කරන, බුද්ධිය මුල්කර ස්වාධීනව සිතීමට නිදහස දී ඇති බුද්ධි වර්ධනයට පමණක් නොව ගුණය නුවණ යන දෙකම සමබරව වැඩීමට මග පෙන්වන වෙනත් ආගමක් ලොව තිබේද? මේ නිසා බුදුරජාණන් වහන්සේ ලෝ පහල වූ ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා හැටියටද සලකයි.

බුදු දහම අන්ධ විශ්වාස මත ගොඩනැගුන මිනිසාගෙන් සත්‍ය වසන් කරන්නා වූ දහමක්ද? අප කළ යුත්තේ විද්‍යාවට පයින් ගැසීමද? එකිනෙකා සමග අන්‍යෝන්‍ය අවබෝධය ඇති කරගෙන විද්‍යාව හා සුහදව වැඩකිරීම මනාව වර්ගයා ගේ හිත සුව පිණිස වන්නේ නොවේද? අන් ආගම් මෙන් එළිදරව් වන සත්‍යයනට බියේ, අපද විද්‍යාවට බිය වී එයට යුද්ධ ප්‍රකාශ කිරීමට කිසියම් තර්කානුකූල හේතුවක් තිබේද? යන්න ගැන දෙවරක් සිතා බැලිය යුතු වන්නේද යන්න සිතා බැලීම වටී.

මෙහිදී සිහිකරගත යුතු ඉතා වැදගත් කරුණක් නම් ගින්දර වුවද නිසියාකාරව පාවිච්චි කිරීමට නොදැන එය පරිහරණය කරන්නේ නම් එයින් විපතක් සිදුවිය හැකි බවය. ගින්දර වලට අපව විනාශ කිරීමට ඇති හැකියාව ගැන දැන දැනත් එය අප බුද්ධිය මෙහෙයවා පාලනයකට නතුව පරිහරණයට ගනුයේ එහි ඇති වටිනාකම දන්නා නිසාවෙනි. මෙසේ අප බුද්ධියට මුල් තැන දී, පාලනයක් ඇතිව ගින්දර පාවිච්චි කිරීම නිසා එය අද අපට නැතිවම බැරි ප්‍රයෝජනවත් දෙයක් බවට පත් වී ඇති බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇත. විද්‍යාව හා බුදුදහම එක් වී යන්නේ නම් එම එක්ව යන ගමන ගැනද මෙසේම සිතාගත යුතුයි.

මෙසේ අතිභයංකර ස්වභාවයක් ගැබ්ව ඇති ගින්දර වුවද මිනිසා බුද්ධියෙන් මෙල්ලකර, එය මානව වර්ගයාගේ සුභ සිද්ධිය හා හිත සුව පිණිස ප්‍රයෝජනයට ගැනීමට දක්ෂ වී ඇත. ඇත්තෙන්ම කියතොත් අප වටා ඇති සියළු දේත්, අප පාවිච්චි කරන්නා වූ සියළු දේත් බුද්ධියෙන් තොරව, භාවිතා කළ යුතු නිසි ආකාරය නොදැන, පමණ නොදැන, මාත්‍රාව ඉක්මවා භාවිතා කළහොත් ඒ හැම දෙයකින්ම භයානක ප්‍රතිඵල ඇතිවිය හැකිය.

උදාහරණයකින් මෙය පැහැදිලි කරතොත්, ජලය, සුළඟ, කෑම බීම, බේත් හේත් ආදිය මෙන්ම භාවිත කරන ආම්පන්න (මන්නා, පිහි, උදළු ආදි මෙවලම්) ඇතුළුව යාන වාහන ආදියෙන්ද සිදුවිය හැකි අනතුරු බොහෝමයි. මේවායේ ගැබ්ව ඇති විනාශකාරී ප්‍රභවය දැන, හැඳින මුත්, අප ඒවාට පයින් නොගසා, කුනු බක්කියට විසි නොකර, මේ හැම දෙයක්ම මිනිස් බුද්ධියෙන් මෙල්ලකර, තම ප්‍රයෝජනය පිණිස උපයෝගි කරගෙන ඇත්තේ හේතුවක් ඇතිව නොවේද?

විද්‍යාව අවශ්‍ය වන්නේ මානව වර්ගයාගේ සුභ සිද්ධිය, හිත සුව පිණිස මෙන්ම, ආගම දහමක අවශ්‍යතාව වන්නේත් මිනිසාගේ සුභ සිද්ධිය හා හිත සුව පිණිසමයි.

මේ දෙක ප්‍රතිවිරුද්ධ අතට ගමන් කරන්නා වූ දේවල් නොව එක අරමුණක් ඇතිව එකම දිශාවකට ගමන් ගන්නා දේ වීම යන්න ගැන අප විශේෂ අවධානය යොමු කළ යුතුය. මෙයින් එකක් හෝ පීලි පැන ඇත්නම් හෝ පීලි පනින විට එය නිවැරදි මඟට ගැනීමට අනෙකට හැකියාවක් ඇත. මේ දෙකේ දුරස්ථභාවය වැඩි වන්න වන්නම පීලි පැනීමට ඇති ඉඩකඩද වැඩි වේ.

මේ දෙකෙන්ම මානව වර්ගයාට විවිධාකාර මට්ටමේ සේවයන් සිදු වන බවද සිහි කළ මනාය. එම නිසා මේ යුගයේදී ආගම හා විද්‍යාව සමබරව පවත්වා ගැනීමට අප වෙහෙස ගත යුතුය. විද්‍යාවත්, ආගම දහමත් යෙදී සිටිනුයේ, හිත් පිත් ඇතිව ඒවා විසින්ම යන ගමනක නොව ඒවා අදහන ඒවාට පන පොවන, ඒවාහි පිටුපස ගමන් කරන මනුෂ්‍ය වර්ගයා ගමන් ගන්නා දිශාව අනුව වන බව අමතක නොකළ මනාය.